Wednesday, 31 March 2021 - 15:51

# ආපදා අවදානම් අවම කරගැනීමට තරුණ ප්‍රජාවේ දායකත්වය

Facebook Twitter WhatsApp Viber LinkedIn





පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා අවදානම් අවම කරගැනීම සඳහා තරුණ ප්‍රජාව සම්බන්ධ කරගැනීමට ඇති හැකියාව පිළිබඳ තමන් සතු දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ අදහසින්, "පරිසරය සඳහා තරුණ නායකයෝ-2021" ('Young Leaders for Environment 2021') නමින් විශේෂ සමුළුවක් සංවිධානය කිරීමට ChildFund Sri Lanka සංවිධානය පියවර ගත්තේය. එහිදී ChildFund Korea සංවිධානය මගින් ලැබුණු මූල්‍යාධාර මත ChildFund Sri Lanka ක්‍රියාත්මක කළ තුන් අවුරුදු ව්‍යාපෘතියක් යටතේ දියත්වුණු විවිධ වැඩසටහන් පිළිබඳ අදහස් හුවමාරු කරගැනුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සොබාදහම සංරක්ෂණ අන්තර්ජාතික සංගමයේ (IUCN) තාක්ෂණික සහාය ද ලැබී තිබුණි.

කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු මෙම අවස්ථාවට, රාජ්‍ය අංශ නියෝජිතයින්, ChildFund සාමාජිකයින්, පෞද්ගලික අංශ ආයතන නියෝජිතයින්, වෙනත් දෙස් විදෙස් ආයතන නියෝජිතයින්, සහ ව්‍යාපෘති ක්‍රියාවට නංවනු ලබන ආයතනවල නියෝජිතයින් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා අවදානම් අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ ChildFund Sri Lanka සංවිධානය ක්‍රියාත්මක කළ වැඩසටහන් ප්‍රදර්ශනය කිරීම, එම වැඩසටහන් මෙහෙයවන ලද තරුණ ප්‍රජාවට තම ප්‍රතිඵල පිළිබඳව දෙස් විදෙස් නියෝජිත පිරිසක් හමුවේ සාකච්ඡා කිරීමට අවස්ථාවක් උදාකර දීම සහ ජාතික මට්ටමේ සැලසුම් සම්පාදනය තුළදී පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා අවදානම් අවම කරගැනීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ට බලපෑම් සිදුකිරීම යනාදිය මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණු විය.

ශ්‍රී ලංකාව යනු, ගංවතුර, නියඟය සහ නායයාම් මෙන්ම මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා පීඩාවට පත්ව සිටින රටකි. මෙවැනි ආපදා තත්ත්වයන්ට බඳුන්වන ශ්‍රී ලාංකිකයින් බහුතරයකට තම ජීවන පැවැත්ම පිළිබඳ බරපතල අර්බුදයකට මුහුණ පෑමට ද සිදුව තිබේ. එබැවින් මෙම ආපදා අවදානම් අවම කරගැනීම සඳහා තරුණ සහභාගීත්වය වැඩිකරගැනීමේ සහ දේශීය ප්‍රජාවගේ ජීවනෝපාය සුරක්ෂිතභාවය වැඩිකරගැනීමේ අදහසින් 2015 වසරේ පටන් මෙරට තරුණ ප්‍රජාව මගින් මෙහෙයවනු ලබන ආපදා අවදානම් කළමනාකරණ වැඩසටහන් සඳහා ChildFund Sri Lanka ආයෝජනය කර ඇත. ඒ යටතේ ස්වාභාවික මෙන්ම ස්වාභාවික නොවන ආපදා යන දෙවර්ගයේම අයහපත් ප්‍රතිඵල වළක්වාගැනීමට, තරුණ ප්‍රජාවේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන පාරිසරික පද්ධති පදනම් කරගත් ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමට ඇති හැකියාව පිළිබඳ පුළුල් අවධානයක් යොමු කර තිබේ.

## දවසේ වීඩියෝව



## Latest Headlines


හග්ගල රිය අනතුරකින් 3ක් මරුට

ස්විස් හමුදාවට බැඳෙන කාන්තාවන්ට 'ස්ත්‍රී යට ඇඳුම්' ඇඳීමට අවසර

මැතිවරණ ජයගන්න සියල්ලන් එකතුකරගමු

කඩාදමා තිබූ නිවසකින් හෙරොයින් කිලෝ 1ක්

පොල් තෙල් බවුසර් ගැන අධිකරණය දුන් නියෝගය







## දවසේ කාලගුණ අනාවැකිය

+30° C H: +31° L: +27°
Colombo
Thursday, 01 April
See 7-Day Forecast

| Fri | Sat | Sun | Mon | Tue | Wed |
|---|---|---|---|---|---|
| +30° | +30° | +30° | +30° | +30° | +30° |
| +27° | +27° | +27° | +27° | +27° | +26° |

එමෙන්ම ඒ ඒ ප්‍රජාවන්ට අදාළව පවතින ආපදා සම්බන්ධ ගැටලු හඳුනාගැනීමට, මෙම ව්‍යාපෘතිය යටතේ දැනුම ගොඩනැංවීමත්, තරුණ පරපුරේ ධාරිතාව නැංවීමත් අපේක්ෂා කෙරේ. ප්‍රජා ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන් සතු ශක්‍යතාව වර්ධනය කරගැනීමට සහාය වීම ද මෙම ව්‍යාපෘතියේ තවත් අපේක්ෂාවකි. මෙම ව්‍යාපෘතියේ අවසාන අදියරේදී, හඳුනාගනු ලැබූ ගැටලු විසඳීම සඳහා තරුණ පරපුර පාදක කරගත් ස්වභාවික මැදිහත්වීමක් සඳහා තරුණ පරපුරට සහාය වීමට ද අපේක්ෂිත ය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ, මඩකලපුව, නුවරඑළිය, මුලතිව් හා පුත්තලම යන දිස්ත්‍රික්ක හතරේ හඳුනාගත්, අවදානමට පාත්‍ර වී ඇති පාරිසරික පද්ධති ඉලක්ක කරගනිමිනි.

මෙම සම්මන්ත්‍රණය සඳහා ChildFund India & Sri Lanka හි අධ්‍යක්ෂිකා නීලම් මකිජානි මහත්මිය, ChildFund Korea හි මානුෂික ආධාර ව්‍යාපෘතියේ කළමනාකරු උන්ගායේ වොන්ග් මහතා ඇතුළු ප්‍රවීණ දේශකයෝ රැසක් සම්බන්ධ වූහ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල්, විශ්‍රාමික මේජර් ජෙනරාල් එස්. රණසිංහ මහතා සම්මන්ත්‍රණයේ මුඛ්‍ය දේශනය පැවැත්වීය.
සම්මන්ත්‍රණයේ පළමු භාගයේදී 'තරුණ පරපුර විසින් මෙහෙයවනු ලබන පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා කළමනාකරණ අවම කරගැනීම' සම්බන්ධයෙන් ගෝලීය සහ දේශීය තත්ත්වය පිළිබඳ වැඩි අවධානයක් යොමුවිය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පාරිසරික වැඩසටහනේ (UNEP), ආපදා සහ ගැටුම් අනු-වැඩසටහන යටතේ ආපදා අවදානම් අවමකිරීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක ආචාර්ය කැරෙන් සුඩ්මියර්-රියුක්ස් මහත්මිය මෙහිදී ගෝලීය තත්ත්වය පිළිබඳ තම අදහස් දැක්වූ අතර, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලයේ ජාතික දේශගුණික මූල්‍ය උපදේශක රංග පල්ලවල මහතා එහි දේශීය තත්ත්වය පිළිබඳ පැහැදිලි කළේය.

සම්මන්ත්‍රණයේ දෙවැනි භාගයේදී තරුණ ප්‍රජාව අත්කරගත් ප්‍රතිඵල පිළිබඳ සාකච්ඡාවට බඳුන් විය. ඒ අනුව මඩකලපුව, පුත්තලම, මුලතිව් සහ නුවරඑළිය යන ප්‍රදේශවල බිම් මට්ටමෙන් ක්‍රියාකාරී වූ තරුණ සංවිධානවල නියෝජිතයෝ තම ක්‍රියාකාරකම් පිළිබඳව විස්තර කළහ. සම්මන්ත්‍රණයේ අවසාන අංගය වශයෙන් විශේෂ විද්වත් සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය කර තිබුණි. ඊට IUCN හි ශ්‍රී ලංකා නියෝජිත ආචාර්ය ආනන්ද මලවිතන්ත්‍රි, ChildFund Sri Lanka මෙරට කළමනාකරු නාලක සිරිවර්ධන යන මහත්වරු මෙන්ම මඩකලපුව තුරුක්කා තරුණ සමාජයේ ලේකම් තවපුතල්වන් තවපිරාජා, නුවරඑළිය රදැල්ල ඩොජ්ස් තරුණ සමාජයේ සභාපති එස්. රොක්ශාන්තන් යන තරුණ නායකයෝ ද සම්බන්ධ වූහ. මෙම විද්වත් සාකච්ඡාව මෙහෙයවනු ලැබුවේ ChildFund Sri Lanka හි තාක්ෂණික විශේෂඥ කෞශාල් අත්තනායක මහතා විසිනි. විද්වත් සාකච්ඡාවෙන් අනතුරුව ව්‍යාපෘති ප්‍රකාශනය එළිදැක්වුණු අතර, තරුණ පරපුර විසින් මෙහෙයවනු ලබන පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා කළමනාකරණ අවම කරගැනීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සමන්ත ද මෙල් මහතාගේ දේශනයෙන් අනතුරුව සම්මන්ත්‍රණය නිමාවට පත්විය.

ChildFund Sri Lanka පිළිබඳව...

ChildFund Sri Lanka යනු අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක ළමා සංවර්ධන සංවිධානයකි. එය පසුගිය වසර 40ක කාලය පුරාවට මෙරට ළමුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් විශාල සේවයක් ඉටු කර ඇත. විශේෂයෙන්ම මෙරට දිස්ත්‍රික්ක 10ක, අවවරප්‍රසාදිත පවුල්වලට අයත් ළමුන් ලක්ෂ 2කගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපත වෙනුවෙන් ChildFund කැපවී ක්‍රියා කරයි. ඒ යටතේ, අධ්‍යාපනය, පෝෂණය, තරුණ සවිබලගැන්වීම්, ආබාධ සහිත ළමුන් අන්තර්කරණය කිරීම, ළමා ආරක්ෂාව, පාරිසරික හා ආපදා අවදානම් අඩුකරගැනීම යන ක්ෂේත්‍ර ඔස්සේ දේශීය දරු පරපුර නඟාසිටුවීමට අරමුණු කර තිබේ. මෙරට ළමා පරපුර සහ තරුණ පරපුර, තමන්ගේ උපරිම හැකියාවන් කරා පිවිසිය හැකි සෞඛ්‍යසම්පන්න, ආරක්ෂිත සහ සහයෝගශීලී පරිසරයක හැදී වැඩෙන බව තහවුරු කිරීම ද ChildFund හි ප්‍රමුඛ අභිලාෂයකි.


Facebook | Twitter | WhatsApp | Viber | LinkedIn




2021අප්‍රේල් මස01

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතිවිය හැකි වැසිස්වල්පයක් හැරුණු කොට දිවයිනේ සෙසු ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වැසි රහිත කාලගුණ තත්ත්වයක් පවතී. උතුරු සහ උතුරුමැද පළාත්වලත් පුත්තලම දිස්ත්‍රික්කයේත් විටින්විට පැ.කි.මී. 40 පමණ දක්වා තරමක් තදසුළං ඇතිවියහැක.


Rupee Exchange Rate

| | in LKR |
|---|---|
| Australia | 151 |
| Switzerland | 211 |
| EU | 234 |
| United Kingdom | 275 |
| Hong Kong | 25.7 |
| Japan | 1.8 |
| United States | 200 |
| | 1 Apr 21 |

දවසේ කාටූනය






## More News



### වැලිබල් වන් සහ හේලීස් සමාගම් දෙකෙන් ධම්මික පෙරේරාට ලාභාංශයක්

Wednesday, 31 March 2021 - 15:18

මෙරට ප්‍රකෝටිපති ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා පාලක කොටස් හිමිකාරිත්වය දරන ප්‍රධාන සමාගම්... Read more



### ‘කැදැල්ල’ කොමර්ෂල් බැංකු කුටියේ ණය සහ ලීසිං අඩු පොලියට

Wednesday, 31 March 2021 - 13:38

පසුගියදා පැවැත්වුණු ‘කැදැල්ල’ ප්‍රදර්ශනයේ කොමර්ෂල් බැංකු කුටියට පැමිණි ජනතාවට නිවාස ණය,... Read more



### ප්‍රාදේශීය කර්මාන්තපුර ඉඩම් කොටස් ආයෝජකයින් වෙත

Wednesday, 31 March 2021 - 12:56

ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් නාලන්ද... Read more

© 2021 All Rights Reserved. newday.lk